WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,581 — 1958 නොවැම්බර් 11 වැනි අඟහරුවාද — 11.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ජේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1950 අංක 25 දරණ ආහාර පාලන පණත

#### අංක 103 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පණතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, යාපනේ අර්ධද්වීපයෙන්, යාපනේ නියෝජ්‍ය ආහාර පාලක තැනගේ හෝ උප ආහාර පාලක තැනගේ බලපත්‍රයක් නැතිව හා එවැනි බලපත්‍රයක සඳහන් කොන්දේසිවලට පටහැනිවද, වී රැගෙන යාම හෝ රථ වාහන වලින් ගෙන යෑම මෙම නියෝගයෙන් තහනම් කරමි.

මේ නියෝගය සඳහා ''යාපනේ අර්ධද්වීපය'' නමින් හැඟවෙන්නේ, පූනකරිනුනුක්කයි ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශය සහ පච්චලපල්ලෙයි-කරච්චි ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කරච්චි කොටස ද අතහැර යාපනේ ආදයම් දිස්ත්‍රික්කයයි.

1958 නොවැම්බර් 7 වැනි දින,
කොළඹ දීය.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම සහ ආහාර ඇමති.

---

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝගය මවිසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 4 වැනි වගන්තියේ 7 වැනි අකුරු වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම සහ ආහාර ඇමති.

1958 නොවැම්බර් මස 7 දින,
කොළඹ දීය.

#### උපලේඛනය

| නියෝගයේ දිනය | නියෝගය දුන් බලධාරියා | නියෝගය බලපවත්වන ද්‍රව්‍යය | නියෝගය පලකළ ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 58.8.23 | ... කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | සහල් ... | ... 58.8.27 දින අංක 11,505 |

3365—ජේ. ඇන්. ආර් 26811—5,187 (11/58)

# මිල පාලන දැන්වීම්

ටී/14/58 වැනි අංකය දරණ මිළ නියෝගය. — අතිරේක ආහාර ද්‍රව්‍ය.

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

(ආහාර) නියෝජ්‍ය මිළ පාලක තැන්පත් ඇන්ටන් රොත්වෙල් මැකෙයිසර් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් (ආහාර) නියෝජ්‍ය මිළ පාලක කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව —

(1) 1958 සැප්තැම්බර් 22 වෙනි දින හා අංක 11,529 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 සැප්තැම්බර් 17 වන දිනය හා අංක ටී/13/58 දරණ ආහාර මිළ නියෝගයේ 1 වැනි තීරයේ සඳහන් අර්තාපල් පිළිබඳව එම උපලේඛනයේ 2, 3 සහ 4 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩර යක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද 2, 3 සහ 4 වැනි තීර ශීර්ෂයන්හි සඳහන් ප්‍රදේශ තුළ විකිණිය හැකි වැඩිම මිළ 2, 3 සහ 4 වැනි තීරයන්හි සඳහන් මිළ ගණන් වේ.

(3) මීට යාකර ඇති පළමු වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය දෙවැනි උපලේඛනයේ පළමු වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන්හි සිල්ලර වශයෙන් විකිණීමේදී විකිණිය හැකි වැඩිම මිළ රාත්තලක්, ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය තුළ විකිණීම සඳහා යොද ඇති පළමු වැනි උපලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් මිළ දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් මිළ සමහ වැඩිකිරීමෙන් බවත් —

(4) මෙම නියෝගය සඳහා :

(අ) තොග වෙළඳාම යනුවෙන් අදහස් කරනුයේ පළමුවැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය එකම අවස්ථාවකදී දළ බර හොණ්ඩරයක් හෝ වැඩි ගණනක් විකිණීම හෝ යලිත් විකිණීමය.

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

මෙම නියෝගයෙන් නියම කරමි.

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමහ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමීත්වයේ හෝ පාලනයට යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා — " රාත්තල " හෙවත් " රා. " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණනසෑම තැනැත්තකු හා උපලෙබනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් මිළයට ගන්නා ඉල්ලුව හොත්, පහත සඳහන් විස්තර — එනම් :

(අ) විකුණූ දිනය:
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ;
(ඉ) විකුණූ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය, ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

(9) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත්, මෙම මිළ නියෝගයෙන් නියම කරන වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වන බව නියම කරමි.

(10) ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(11) චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දල බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(12) ජපානයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් විසිපහක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(13) ලෑලි පෙට්ටිවල හැර වෙන යම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(14) මෙම නියෝගය සඳහා " ශුද්ධ " යන්නෙන් හැඟ වෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ අර්තාපල් වල පමණක් බර බවද නියම කරමි.

1958 ඔක්තෝබර් 21 වැනි දින අ. භා. 3ට ත්‍රිකුණාමලය කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඇන්ටන් ආර්. මැකෙයිසර්,
ත්‍රිකුණාමලයේ (ආහාර) නියෝජ්‍ය මිළ පාලක.

## පළමුවැනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| විස්තර | ත්‍රිකුණාමල නගරයේ සහ කඩවත් කරවන නිලධාරි තැනගේ කොට්ඨාශය තුළ හොණ්ඩර යක වැඩිම තොග මිළ | ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සභා කොට්ඨාශය තුළ ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිළ | කොඩ්ඩියාර් පත්තුව සහ තම්පලකාමම් පත්තුව කර වන නිලධාරීන්ගේ කොට්ඨාශය තුළ දළ බර හොණ්ඩර යක වැඩිම තොග මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| අර්තාපල් ... ... ... | 31 86 ... | 0 34 ... | 33 26 |

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ගම්මුලාදැනි කොට්ඨාශය | 2 වැනි තීරය<br>1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය ත්‍රිකුණාමලය පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ විකුණන මිළ වැඩිකළ හැකි මිළ<br>ශත |
|---|---|
| උප්පවලිය සහ සාම්බල්තිව් ... ... ... ... ... ... | නැත |
| වෛනබෙ, වෙල්ලමනල්, තම්පලාගමුව සහ නිලාවලිය ... ... ... ... | 01 |
| සින්න කින්නියාව, පෙරිය කින්නියාව, කුරුන්වාන්කර්නි, උප්පාර්, කන්තලේ, මුතූර්, අක්කරෙයිචේනෙයි, සම්පූර්, මල්ලිකතිව්, කිලිවෙට්ටි, තෝප්පූර්, පල්ලිකුඩිරුප්පු සහ කුඹුරුපිටි ... ... ... | 02 |
| කුනිතිව්, ඊච්චලම්පට්ටෛ, කුච්චවලි, පැනිකෙම්ටියාව සහ ගෝමරන්කඩවල ... ... ... | 03 |
| තිරියායි, මැදවච්චිය සහ ගල්කඩවල ... ... ... ... ... | 02 |
| පුල්මුටෛයි ... ... ... ... ... ... ... | 05 |
| තෙන්නමරවාඩිය සහ පරන මැදවච්චිය ... ... ... ... ... | 06 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමෙ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළයි. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකියි.

---

**15 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

ගාළු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3(2) වැනි වගන්තියෙන් මා හට පැවරී තිබෙන බලතල අනුව :—

(1) 1958 අගෝස්තු 23 වැනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු 14 වැනි දින අංක 13 දරණ ආහාර මිළ නියෝගයේ 2වැනි තීරයේ සඳහන් අර්තාපල් පිළිබඳව එම උපලේඛනයේ 3 සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩර යක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දූන් පටන්, මේ උපලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනුලබන බවත්,

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද, නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ, 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත් තෙකු විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම්,

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ;
(ඉ) විකුණූ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය, ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බව නියම කරමි.

(8) උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ලබන ද්‍රව්‍ය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත්, උපලේඛනයේ 3 වැනි 4 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(9) ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වනලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(10) චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(11) ජපානයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වනලද අර්තාපල් විකුණන විට දළබරින් තාර බර වශයෙන් රාත්තල් විසිපහක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බව ද,

(12) ලෑලි පෙට්ටිවල හැර වෙනයම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බව ද,

(13) මෙම නියෝගය සඳහා ''ශුද්ධ'' යන්නෙන් හැඟ වෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරිවන බර හෝ අර්තාපල්වල පමණක් බර බවද, නියම කරමි.

1958 නොවැම්බර් මස 4වැනි දින අ.භා. 2ට ගාල්ලේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
සහකාර ආහාර මිළ පාලක තැන, ගාළු පාලන දිස්ත්‍රික්කය.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| පළාත් | විස්තර | තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොන්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
| 1. ගාලු නාගරික සීමාව සහ කඩවත්සතර ... | | | |
| 2. අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව ... | | | |
| 3. දෙඩන්දූව සුළු නගර සභා සීමාව ... | | | |
| 4. හික්කඩුව සුළු නගර සභා සීමාව ... | අර්තාපල් ... | 30 0 ... | 0 32 |
| 5. වතුගෙදර සුළු නගර සභා සීමාව ... | | | |
| 6. බලපිටිය සුළු නගර සභා සීමාව ... | | | |
| ගම්කායඃ සභා— | | | |
| අහන්ගම ... ... | | | |
| අක්මීමන ... ... | | | |
| බද්දේගම ... ... | | | |
| බටපොල ... ... | | | |
| බෙන්තොට ... | | | |
| බෝපේ ... ... | | | |
| ඇල්පිටිය ... ... | | | |
| හබරාදූව ... ... | | | |
| හික්කඩුව ... ... | | | |
| කොස්ගොඩ ... | | | |
| කරන්දෙනිය ... | අර්තාපල් ... | 30 0 ... | 0 32 |
| කෝදගොඩ ... | | | |
| කොට්ටව ... ... | | | |
| මාදම්පෙ ... ... | | | |
| නාගොඩ ... ... | | | |
| පෝද්දල ... ... | | | |
| රත්ගම ... ... | | | |
| තෙලිකඩ-මාපුවාන ... | | | |
| වදුරඹ ... ... | | | |
| වැලිවිටිය–දිවිතුරේ ... | | | |
| වැයිහේන ... ... | | | |
| වේරගොඩ... ... | | | |
| හිනිදුම සහ ඕපාත ගම්කායඃ සභා සීමාවන් ඇතුළත | අර්තාපල් ... | 31 0 ... | 0 35 |
| නෙළුව ගම්කායඃ සීමාව ඇතුළත ... | අර්තාපල් ... | 32 0 ... | 0 36 |

**සැළකිය යුතුයි.**—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන්විකිණිය නොහැකිය.

---

**16 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය (වියලි මිරිස්)**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

ගාළු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3(2) වැනි වගන්තියෙන් මා හට පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 23 වැනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1958 අගෝස්තු 14 වැනි දින අංක 13 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, එම උපලේඛනයේ 3 සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළද, මේ දැන්පටන් මේ උපලේඛනයේ 3 වැනි සහ 4වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව, 1958 අගෝස්තු 23 වැනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද අතිරේක ආහාර සම්බන්ධව 1958 අගෝස්තු 14 වැනි දින අංක 13 වැනි ආහාර මිළ නියෝගයේ 3 සිට 8 දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ සැටියට සැලකිය යුතු ලෙසද, මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් මස 5 වැනි දින පූ. භා. 10ට ගාල්ලේ දී අත්සන් තබන ලදි.

එච්. ඩී. වීරරත්න,
සහකාර ආහාර මිළ පාලක තැන, ගාළු පාලන දිස්ත්‍රික්කය.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>පළාත් | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. ගාළු නාගරික සීමාව සහ කඩවත් සතර ... | | | |
| 2. අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා සීමාව ... | | | |
| 3. දෙඩන්දූව සුළු නගර සභා සීමාව ... | වියලි මිරිස් ... | 89 0 ... | 0 88 |
| 4. හික්කඩුව සුළු නගර සභා සීමාව ... | | | |
| 5. වතුගෙදර සුළු නගර සභා සීමාව ... | | | |
| 6. බලපිටිය සුළු නගර සභා සීමාව ... | | | |
| ගම්කාය්‍ය සභා— | | | |
| අහන්ගම ... ... ... | | | |
| අක්මීමන ... ... ... | | | |
| බද්දේගම ... ... ... | | | |
| බටපොල ... ... ... | | | |
| බෙන්තොට ... ... ... | | | |
| බෝපෙ ... ... ... | | | |
| ඇල්පිටිය ... ... ... | | | |
| හබරාදූව ... ... ... | | | |
| හික්කඩුව ... ... ... | | | |
| කොස්ගොඩ ... ... ... | | | |
| කරන්දෙනිය ... ... ... | වියලි මිරිස් ... | 89 0 ... | 0 88 |
| කෝද්දගොඩ ... ... ... | | | |
| කොට්ටව ... ... ... | | | |
| මාදම්පෙ ... ... ... | | | |
| නාගොඩ ... ... ... | | | |
| පෝද්දල ... ... ... | | | |
| රත්ගම ... ... ... | | | |
| තෙලිකඩ-මා පුවාන ... ... | | | |
| වදුරඹ ... ... ... | | | |
| වැලිවිටිය-දිවිතුරේ ... ... | | | |
| වැයිහේන ... ... ... | | | |
| වේරගොඩ ... ... ... | | | |
| හිනිදුම සහ ඕපාතගම් සභා ... ... | වියලි මිරිස් ... | 90 0 ... | 0 90 |
| නෙළුව ගම්කාය්‍ය සභාව ... ... | වියලි මිරිස් ... | 100 0 ... | 0 95 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැක.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.